14 වන පිටෙන්

“එහෙනම් ඔය මණි මේඛලාව කාන්තා නාන ඇඳුමක් වෙන්නට ඇති. නේද හාමුදුරුවනේ?“ ධර්මේ නැවත ඇසීය.



'මිණිමෙවුල' මෙවැනි ආභාරණයක්ද?

**මිණිමෙවුල මෙවැනි ආභාරණයක්ද?**

පන්තියේ බාලිකාවන්, ලජ්ජාවෙන් බිමට නමා ගත් තමන්ගේ මුහුණු, පොත් වලින් ආවරණය කර සඟවා ගැනීමට උත්සාහ ගන්නවා දකින්නට ලැබිණ.

මෙවර, තරමක් කෝපවූ බව පෙන්වූ ස්වාමීන් වහන්සේ, තම ආසනයෙන් නැගිට, උස් හඬින්, තරවටුවක ස්වරූපයෙන්, ධර්මේ මෙසේ ඇමතීය.

“ධර්මසේන, මම දන්න මළ ඉලවු නාන ඇඳුමක් නැහැ... ඔය කවි පෙළේ සාහිත්‍ය රස විඳින්න තාලය, ශබ්ද රසය, ශෘංගාරය, එළිසම වගේ දේවල් හොඳටම ඇති. ඔය වැඩක් නැති විවේචන ඔතනින් නවත්වමු...”

බියපත්වූ ධර්මේ නිශ්ශබ්ද විය. පන්තියම මීයට පිම්බා සේ නිහඬ විය ස්වාමීන් වහන්සේ තරමක් උස් හඬින් ඊළඟ ශිෂ්‍යයා කැඳවීය. පන්තියේ තිබුණු සාහිත්‍යද රස වින්දන සොඳුරු වටපිටාව, එකවරටම අතුරුදන් වූවා සේ විය. පරාජිත භාවයක් පෙන්වූ ධර්මේ, කරබාගෙන ආපසු පැමිණ තම ආසනයේ හිඳ ගත්තේය.

කවි පෙළෙහි වැඩි විස්තර සෙවීමට තව දුරට ගියානම්, පහසුවෙන් විසඳිය නොහැකි නොයෙක් අදහස් උදහස් මතු වන්නට ඉඩ තිබෙන බව ස්වාමීන් වහන්සේ තේරුම් ගන්නට ඇත.

එදින විවේක වෙලාවේ, විද්‍යාලයයේ කාර්යාල සේවක මහතා අත, ස්වාමීන් වහන්සේ පන්ති නායකයා වූ මා හට පණිවුඩයක් එවා තිබිණ. එය, මට විවේක වෙලාවේ, ධර්මේ සමග උන්වහන්සේගේ කාමරයට එන ලෙස දැන්වූ පණිවුඩයකි.

මෙය අප දෙදෙනාට පමණක් නොව මුළු පන්තියටම මහත් භීතියට කරුණක් විය. සමහරු ධර්මේ ප්‍රසිද්ධියේ කී දෙය අනුමත කල නොහැකි බවද කීවෝය. පන්ති නායකයා වූ මාද කැඳවුයේ, මෙම සිද්ධිය විදුහල්පතිතුමාට දන්වා දඬුවමක් ලබාදීමට විය හැකි බව අපට සිතුණි.

ස්වාමින්වහන්සේගේ කාමරයට ගිය අපි, උන්වහන්සේට වැඳ එකත් පස්ව සිටියෙමු.

අප දෙස බලාගත්වනම සිටි ස්වාමීන් වහන්සේ, මහ හඬින් සිනාසෙන්නට විය.....

අපට මෙය අදහා ගන්නට නොහැකි දෙයකි. අප බලාපොරොත්තු වුයේ හොඳ බැණුමකි. එහෙත් උන්වහන්සේ වෙන අවස්ථාවලටත් වඩා සතුටකින් සිටින බව අපට පෙනුණි.

“මේ කොල්ලනේ...., මම උඹලට එන්නට කිවේ බනින්නට, ගහන්නට එහෙම නොවෙයි. තැනට සුදුසු විධියට හැසිරෙන්නට ඕනෑ ආකාරය කියා දෙන්නටයි...”

අපට මහත් අස්වැසිල්ලක් දැනිණ. උන්වහන්සේ තවදුටත් මෙසේ කීවෝය.

“පන්තියේදී මොන උලව් දෙය උනත් සීමාවකට කතා කරන්න ඕනෑ....., අර මිණි මෙවුලේ කතාවෙන් මම තව පොඩ්ඩෙන් ලොකු අමාරුවක වැටෙනවා.. පන්තියේ කෙල්ලෝ නොසිටියානම් මම උඹලට ගෑණු නාන හැටි හොඳට කියලා දෙනවා.” යයි සිනහසෙමින් පැවසුහ.

ස්වාමින් වහන්සේගේ අවවාදය අසා, අපි තරමක් අපහසුතාවකින් සිටින බව දැනගත් උන් වහන්සේ,

“මේ....., මටත් අද තමයි වැටහුනේ,

ධර්මසේන විග්‍රහ කරන ආකාරයට ගැඹුරින් සිතා බැලූවහොත්, ඔය කවි පන්තියේ හැටියට, කාන්තාවෝ දිය කෙළි කෙළින්නේ ඇඳුම් නැතුව වෙන්න ඇතැයි නිගමනයකට එන්නටත් පුළුවනි.” යයි අපට කීවෝය. “මම කොයි එකටත් අනිත් සංදේශ කාව්‍ය වලත් දිය කෙළි වැනුම් ගැන තවදුරටත් ගැඹුරින් කියවා බලා, මේ ගැන තව විස්තර පස්සේ කියා දෙන්නම්.”

“වරදක් වූවානම් සමාවෙන්න හාමුදුරුවනේ” යයි ධර්මේ කී විට

“ඔහොම තමයි තීක්ෂණ බුද්ධියකින් යුතුව කටයුතු කරන එක බොහොම හොඳයි....., ඒ උනත් තැන නොතැන බලා ප්‍රැවේශමෙන් කටයුතු කිරීමත් ඉතාම වැදගත්.” යයි ධර්මානුකූල අවවාදයක් දුන් ස්වාමීන් වහන්සේ ධර්මේගේ හිස අත ගෑහ.

ආපසු පන්තියට පැමිණ සිදුවූ සියලූ දෙය කී විට, පන්තියේ සියලූ දෙනාම අත්පොලසන් නාදයකින් ධර්මේගේ දියකෙළි වැණුම් විග්‍රහයට සතුට පළකළහ.

එවර විභාගයේදී, ධර්මේ ද, මා ද ඇතුළු පන්තියේ සියලූ දෙනාටම පාහේ, සිංහල සාහිත්‍ය විෂයයට අධි සම්මාන ලැබිණ. විශ්ව විද්‍යාලයට ඇතුලත්වී, සිංහල විෂයයක් සහිතව, කළා ගෞරව උපාධියක් සහ පශ්චාත් උපාධි කිහිපයක් ලබාගත්, මගේ පාසැල් මිතුරු ධර්මේ, වසර ගණනාවක් විදේශ සේවයේ යෙදී, රටවල් රාශියක රාජකාරි කර, මෑතදී පරලෝ සැපත් විය.

මෙය, ඔහුට උපහාරයක්ම වේවා


දශක 6 ක් තිස්සේ රසික ඔබ අප පිනවූ

# සිංහල චිත්‍ර කතා වංශ කතාවේ මහ සිත්තරා







අභිනන්දන උළෙල

2019 ජනවාරි 31 බ්‍රහස්පතින්දා සවස 4.30 ට
කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේ දී

විද්වත් කථිකයින්, සුමිතුරන්, සුවහසක් රසික සහෘදයින් පිරිවරා
ඔහුට කෘත ගුණ පුද කෙරෙන, ඒ සොඳුරු සන්ධ්‍යාවට සහභාගි වන්නට,
සහෘද ඔබට කෙරෙන කාරුණික ආරාධනය යි මේ...

ඒ වෙනුවෙන් ඔබට කළ හැකි තවත් යමක් වෙතොත් කරුණාකර අමතන්න,

මෙල්බර්න්
ජගත් 0433 438535
සිසිර 0400 123610
තේජා 0430 449600
වසන්ත ශ්‍රීනාත් 0401 400081

සිඩ්නි
අනුර 0422 328902